# සිංහරාජ වනාන්තරය වයඹදිග බෑවුම ආශ්‍රිත ගැමි බෞද්ධ ජනයාගේ ඇදහිලි හා විශ්වාස

ධම්මික හේවගේ[1]
දර්ශන බණ්ඩාර[2]

## හැඳින්වීම

ජෛව විවිධත්වයෙන් ඉහළ ස්වාභාවික වනාන්තරයක් වන සිංහරාජ වනාන්තරය ආශ්‍රිත ව පිහිටි ගම්මාන රාශියක් දැකිය හැකි වුවත් මෙහි දී අවධානය යොමු කරන්නේ සිංහරාජ වනාන්තරය වයඹදිග බෑවුම ආශ්‍රිත ව පිහිටි කුඩව, පිටකැලේ, පෙතියකන්ද, කෝන්ගහකන්ද, කෙටලපත්තල, කොස්ගුලන යන ගම්මාන හය කෙරෙහි ය. මෙම ගම්මාන හය රත්නපුර දිස්ත්‍රික්කයෙහි කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වෙයි. වනාන්තරය ආශ්‍රිත ජීවන ව්‍යවහාර සහිත කුඩා පරිමාණ තේ වගාවේ නිරත මෙම ගම් වැසියන් සාම්ප්‍රදායික ජීවන රටාවක් සහිත සිංහල බෞද්ධ ජනතාවක් ලෙස හැඳින්විය හැකි ය. එහෙත් බුදුදහමෙන් පරිබාහිර ජන ඇදහිලි හා විශ්වාස පද්ධතියක් ද ඔවුන් අතර වෙයි. මේ ගම්මානයන්හි ජන සංස්කෘතිය පිළිබඳ ප්‍රමාණාත්මක පර්යේෂණ සිදු ව ඇත්තේ අල්ප වශයෙනි. ශ්‍රී ලංකාවේ බුදුදහමේ වර්ධනය පිළිබඳ බහුවිධ ප්‍රවේශ ඔස්සේ අධ්‍යයනය කිරීමේ දී වාචික ඉතිහාස දත්ත (Oral History) මත පදනම් වූ ජනශ්‍රැති අධ්‍යයනයන් භාවිත කරමින් ග්‍රාමීය බෞද්ධ සංස්කෘතිය පැවති හා පවත්නා ස්වභාවයන් විමසීමත් කේන්ද්‍රීය බුදුදහමට පරිබාහිර ව පවත්නා ජන ඇදහිලි හා විශ්වාසයන්හි ස්වභාවයත් මෙහි දී අධ්‍යයනය කෙරෙයි.

## අධ්‍යයනයේ අරමුණ හා වැදගත්කම

මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ සිංහරාජ වනාන්තරය වයඹදිග බෑවුම ආශ්‍රිත සාම්ප්‍රදායික ගම්මානවල දැකිය හැකි ග්‍රාමීය බෞද්ධ සංස්කෘතිය මෙන් ම ඉන් පරිබාහිර ඇදහිලි හා විශ්වාසයන් ද අධ්‍යයනය කිරීම යි. ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියෙහි ජනප්‍රිය ඉසව් පිළිබඳ පර්යේෂණ බහුල ව සිදු වෙතත් චූල මට්ටමේ සංස්කෘතික නියෝජනයක් සහිත ජන පිරිසක් පිළිබඳ සිදු කරන අධ්‍යයනයක් ලෙස මෙම අධ්‍යයනය වැදගත් වේ. බෞද්ධ සංස්කෘතිය චූල ජන සමාජවල පවතින අන්දම හා නිර්ප්‍රභූ ජනතාවකගේ ආගමික විශ්වාස, ඇදහිලි හා පුදපූජා අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ වැදගත්කමක් ලෙස දැක්විය හැකි ය.

---

1 පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.
2 ඉතිහාසය අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.

### අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේද භාවිත කරන ලදී. සිංහරාජ වනාන්තරය වයඹදිග බෑවුම ආශ්‍රිත ව පිහිටි කුඩව, පිටකැලේ, පෙතියකන්ද, කෝන්ගහකන්ද, කෙටලපත්තල, කොස්ගුලන යන ගම්මාන හය ආශ්‍රිත ව මෙම පර්යේෂණය සිදුවිය. පර්යේෂණයට අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී සම්මුඛ සාකච්ඡා සහ සෘජු නිරීක්ෂණය යන ක්‍රමවේද භාවිත කළ අතර ද්විතීයික දත්ත ලබාගැනීමේ දී ලේඛනගත මූලාශ්‍ර භාවිතයට ගනු ලැබීය. දත්ත දායකයන්ගෙන් හා ක්ෂේත්‍ර නිරීක්ෂණයෙන් ලබාගත් තොරතුරු පදනම් කොට ගනිමින් මෙම පර්යේෂණය පෙළ ගැස්වෙන අතර දත්ත ඉදිරිපත් කිරීමේ දී සටහන් හා ඡායාරූප භාවිතයට ගන්නා ලදී.

### සිංහරාජ වනාන්තරය වයඹදිග බෑවුම ආශ්‍රිත ගැමියන්ගේ ආර්ථික ජීවිතය

අසූව දශකය අග භාගය වන තෙක් ම වනාන්තරය ආශ්‍රිත හේන් වගාව හා කිතුල් කර්මාන්තය ගැමියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ග විය. එසේ ම මොවුහු දඩයමේ ද සුරුවෝ වූහ. ඉතා සරල ජීවිතයක් ගෙවූ එකල ගැමියන්ට වඩා වර්තමාන ගැමියා කාර්යබහුල ය. ඊට ප්‍රධාන හේතුව ඔවුන්ගේ වර්තමාන ආර්ථික රටාව යි. වර්තමාන ගැමියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වනුයේ කුඩා පරිමාණ තේ වගාව යි. ඊට අමතර ව  රබර්, කුරුඳු, ගම්මිරිස් වැනි වැවිලි භෝග දැකිය හැකි අතර පොල්, පුවක් යනාදී භෝග වර්ග යැපීම සඳහා පමණක් වෙයි. ප්‍රදේශයේ අනෙක් ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වනුයේ කිතුල් කර්මාන්තය යි. වනාන්තරය හා ගෙවතු ආශ්‍රිත කිතුල් මැදීමෙන් සාදා ගන්නා පැණි, හකුරු අලෙවි කිරීමෙන් බොහෝ දෙනා ආදායම් ලබති. දැව හා දැව නොවන වනජ පරිභෝජනයට හුරු වූ ගැමියෝ නිරන්තර ව ම වනය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යෙදෙමින් ඒ මගින් ද යම් යම් ආර්ථික ප්‍රතිලාභ ලබති. මීට දශක දෙකකට පෙර අතිශය හුදකලා ලෙස පැවති මෙම ගම්මාන කරා සන්නිවේදන උපකරණ පැමිණීමත්, අධ්‍යාපනය හා ගමනාගමන පහසුකම් දියුණු වීමත් හේතුවෙන් පෙර පැවති හුදකලා බවින් මිදෙමින් පවත්නා බව හඳුනා ගත හැකි ය.

### ඇදහිලි හා විශ්වාස

සිංහරාජ වයඹදිග බෑවුමෙහි පිහිටි වනාශ්‍රිත ගම්මාන හයෙහි ම වැසියෝ සිංහල බෞද්ධ වෙති. වසර 250 වඩා පැරණි නො වන මෙම ගම්මානවල වැසියෝ උත්පත්තියෙන් ම බෞද්ධ බව ප්‍රකාශ කරති. ගැමියෝ සියල්ල ම බෞද්ධ වුවත් මේ ගම් හයට ම ඇත්තේ එක් පන්සලක් පමණි. එය ද මේ වන විට භික්ෂු වාසයෙන් තොර ව පවතී. එහෙත් පොහොයට සිල් ගැනීම, දහම් පාසල පැවැත්වීම යනාදී කටයුතු ජනතාව සිදුකරන අතර නිතිපතා පන්සල් යන ගැමියෝ ද සිටිති. පන්සලේ හිමි නමක් නොමැති වුව ද අවමංගල්‍යයක් හෝ වෙනත් දානමය

කටයුත්තක දී වැද්දාගල හෝ කලවානේ වෙනත් පන්සලකින් භික්ෂූන් වැඩම කරවා ගනිති. අවමංගල්‍යයකින් පසු 'හත්දොහේ දානය', 'තුන්මහේ දානය', 'අවුරුද්දේ දානය' යනුවෙන් සෑම සිංහල බෞද්ධ ප්‍රදේශයක ම පවත්නා අකාරයට සංඝගත දක්ෂිණාව සිදුකරති. එ සේ ම වෙසක්, පොසොන්, ඇසළ යන පොහොය අවස්ථාවන්වල දී පහන්කූඩු හදමින්, තොරණ බඳිමින්, කවිමඩු පවත්වමින් උත්සවාකාරයෙන් සැමරීම සිදු කරයි.

බෞද්ධාගමික ජන පිරිසක් වුව ද වෙනත් විශ්වාස හා ඇදහිලි ගරුකරන පිරිසක් බව ද නිරීක්ෂණය කළ හැකි ය. අදෘශ්‍යමාන බලවේග දැඩි ව විශ්වාස කරන මෙහි ගැමියන්ගේ අවමංගල්‍ය චාරිත්‍ර ලංකාවේ සෙසු ප්‍රදේශවලින් සපුරා වෙනස් වෙයි. මෘතදේහය නිවසින් එළියට ගත් පසු සියලු ජනෙල් දොරවල් හැර දමා එම අවස්ථාවේ පිසගත් බත් මුට්ටියකින් බත් ගෙන නිවසේ වහලයට විසි කරයි. අනතුරු ව දෙණ වල කරා රැගෙන යාමේ දී රිටි දෙකක ඇමිණූ කුරුම්බා කෝම්බ දෙකක පත්තු කරන ලද පන්දම් දෙකක් දෙදෙනකු විසින් කර ගහගෙන දෙණ ඉස්සරහින් හා පිටුපසින් රැගෙන යනු ලබයි. වල වටේ තුන්වරක් ගමන් කොට දෙණ මිහිදන් කොට පස් වැටියක් සකස් කොට එහි දෙකෙලවර පන්දම් දෙක ගසයි. අනතුරු ව පස් කන්ද මත 'හෝංදණ්ඩ' යනුවෙන් රිටක් දිග අතට තබා ඒ මත වැල් වළලු තුනක් තබා කුඩා කරු තුනකින් වැල් වළලු රිටට සම්බන්ධ කරයි. කුමන තරාතිරමක අයකුගේ වුව ද සොහොන් බැඳීමක් සිදු නොකරයි.

මෙහි වැසියෝ සිංහල බෞද්ධ වුව ද දේව විශ්වාස හා අමනුෂ්‍ය බලවේග පිළිබඳ දැඩි ව විශ්වාස කරති. දේව විශ්වාස ලෙස පත්තිනි දේව ඇදහිල්ල හා සමන් දෙවි ඇදහිල්ල ප්‍රමුඛ වන අතර වනාශ්‍රිත කටයුතුවල දී ප්‍රමුඛ ව අදහනු ලබන්නේ කොහොඹ දෙවියන් ය. විටෙක 'කොහොඹ දේවතාවා' ලෙස ද විටෙක 'කොහොඹ යකා', 'කොහොඹයා' යනුවෙන් ද හඳුන්වනු ලබයි. කොහොඹ දෙවියන්ට ගෞරව පූර්වක භය පක්ෂපාත බවක් දක්වන ගැමියෝ වනාන්තරයට පිවිසෙන විට කොහොඹ දෙවියන් සිහි කර රැකවරණය පතා අත්තක් කඩා ගසක රඳවා යාමට අමතක නොකරති.

## බුදුදහම හා බැඳුණු දේව විශ්වාස

කලවානේ අරුක්ගොඩ පිහිටි වාර්ෂික දේව තොවිලයට මේ ගම්වල බොහෝ ගැමියෝ සහභාගි වෙති. එසේ ම සමන් දේවාලයේ වාර්ෂික දේව පෙරහර බැලීමට ද සමන් දෙවියන් වැඳීමට ද බොහෝ ගැමියෝ කැමැත්ත පළ කරති. මීට අමතර ව කතරගම දෙවියන් කෙරෙහි ද ඔවුන් තුළ භක්තියක් පවතින බව පෙනෙයි. මොවුන් දිවුරීමේ දී සහ විශ්මය පළ කිරීමේ දී බොහෝ විට භාවිත කරනුයේ 'අම්මප', 'බුදුම්ප', 'සමංදෙයියම්ප' 'සමංකතරේ' යන වචන යි. 'සමංකතරේ' යන්නෙන් එකවර සමන් දෙවියන් සහ කතරගම දෙවියන් සිහිකරයි.

'පත්තිනි දේව මැණියො' මුල් කරගනිමින් සිදු කරන 'කිරි අම්මා දානය' සෑම නිවසක ම පාහේ සිදුකරන ශාන්තිකර්මයක් ලෙස හැඳින්විය හැකි ය. මෙම අභිචාර කර්මය ආරම්භ වන්නේ සහභාගි වී සිටින සියලු දෙනා පංචශීලයෙහි පිහිටුවමිනි. ඒ අනුව පෙනී යන්නේ මෙය දේව කර්මයක් වුව ද ඊට බුදුදහම ප්‍රමුඛ කරගෙන ඇති බව යි. එසේ ම සමන් දෙවියන් ද ඔවුන්ගේ බුහුමනට පාත්‍ර වනුයේ බුදුන්ගේ ශ්‍රීපාද ලාංඡනය පිහිට වූ 'සිරිපාදය' ආරක්ෂා කිරීමට කැපවුණු දේවතාවා වශයෙනි.

## අමනුෂ්‍යයන් පිළිබඳ විශ්වාස

මෙහි ගැමියෝ අමනුෂ්‍ය බලවේග පිළිබඳ දැඩි ව විශ්වාස කරති. මහසෝනා, මෝහිනී, කළුකුමාරයා, බෝඩිලිමා, බහිරවයා, හෝවැද්දා, ප්‍රේතයන්, ග්‍රහ බලපෑම් යනාදී බලවේග ඒ අතර ප්‍රධාන ලෙස සැලකිය හැකි ය. බෙරහඬ නො ඇසෙන රාත්‍රියක් නොමැති තරමට තොවිල්-පවිල්, විනකැපුම්, බලි ශාන්ති යනාදී අභිචාර මේ ප්‍රදේශයේ සුලබ ය. මහසෝන් දිෂ්ටියට තොවිල් ද, ග්‍රහ අපලවලට බලි ශාන්ති හා බෝධි පූජා ද, අනවින-කොඩිවින සඳහා විනකැපුම් ද, ප්‍රේත දිෂ්ටි සඳහා 'පෙරේත තටු' දීම ද, කළුකුමාර දිෂ්ටියට ගර්භරක්ෂණ ශාන්තිකර්මයක් වන 'කුමාර සමයම' ද, බෝඩිලිමා සහ වෙනත් යක්ෂ දිෂ්ටි සඳහා තෙල් සහ නූල් මැතිරීම සහ තොවිල් ද, භූමි ආරක්ෂාවට බහිරව පූජා ද, දුර්භික්ෂ අවස්ථාවල දී මඩු ශාන්තිකර්ම ද මේ ප්‍රදේශයේ සුලබ ව සිදු කරන අභිචාර ලෙස දැක්විය හැකි ය.

## නිගමනය

මෙම ගම්මාන හයේ ම ජනතාව උපතින් ම සිංහල බෞද්ධ වුවත් ඔවුන් බුදුදහමට අමතර ව වෙනත් ඇදහිලි හා විශ්වාස රාශියක එල්බ ගෙන ඇති බව නිගමනය කළ හැකි ය. එසේ ම දේව විශ්වාස හා වෙනත් අමනුෂ්‍ය විශ්වාස අරබයා පවත්වන අභිචාර සෑම එකකට ම පාහේ බුදුගුණ මුල්කරගෙන තිබේ. පත්තිනි දේව ඇදහීම සහ සමන් දෙවි ඇදහීම යනාදී දේව ඇදහීම් බෞද්ධාගමික නැඹුරුවක් සහිත ව සිදුකරන බව පෙනෙයි. එසේ ම යන්ත්‍ර-මන්ත්‍ර මූලික කරගනිමින් සිදු කරන ශාන්තිකර්ම සඳහා ද බුදුගුණ යොදා ගන්නා බව පෙනෙයි. ලංකාවේ අනෙක් ප්‍රදේශවල බෞද්ධ ජනයා මෙන් අවමංගල චාරිත්‍ර සඳහා භික්ෂූන්ගේ සහභාගීත්වය, සාංඝික දාන-මානාදිය පැවැත්වීම යනාදී බෞද්ධ වත්-පිළිවෙත් සිදු කළ ද ඇදහීම් සහ අභිචාර විෂයෙහි දී බෞද්ධාගමික අභිචාරවලට වඩා ප්‍රාදේශීය ජන විශ්වාස මූලික කරගත් අභිචාර කෙරෙහි ප්‍රමුඛ ස්ථානයක් දෙමින් කටයුතු කරන බව නිගමනය කළ හැකි ය. විශේෂයෙන් ම ආරක්ෂාව, රැකවරණය හා රෝග නිවාරණය අරබයා පවත්වන්නා වූ අභිචාර සියල්ලක් ම පාහේ බෞද්ධාගමික ඒවා නොවන බව පෙනී යයි.

**ප්‍රමුඛ පද:** සිංහරාජ වනාන්තරය, ඇදහිලි-විශ්වාස, ගැමියෝ, බුද්දහම, අභිචාර

**ආශ්‍රිත ග්‍රන්ථ**

එල්ලාවල, එච්. (1964). පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

පෙරේරා, හර්ෂ.(2006). *සිංහරාජ සංරක්ෂණය*. මොරටුව: කර්තෘ ප්‍රකාශන.

වීරසිංහ, ඒ. (2002). සිංහල ජනශ්‍රැතිය හැදෑරීම. ගල්කිස්ස: සංස්කෘති ප්‍රකාශන.

Senevirathne, Anuradha. (1984/1985). " Folk Beliefs and Rituals Associated with Rain and Drought" in *Journal of the Royal Asiatic Society - Ceylon Branch* New Series, Vol. XXIX. Colombo: Royal Asiatic Society - Ceylon Branch.

Uragoda, C. E. (1989/1990). "Predential Address: A Scientific Basis for some Traditional beliefs and Practices in Sri Lanka" in *Journal of the Royal Asiatic Society -Ceylon Branch* New Series, Vol. XXXIV. Colombo: Royal Asiatic Society -Ceylon Branch.

Zoysa,N.D and Raheem,R . (1993*). Sinharaja a Rian Forest in Sri Lanka.* March for conservation: Colombo, Sri Lanka.